# භාවිතයෙන් තොර ප්‍රවාද ගැන කීම ම පුස්ස බිඳීමකි

නාගර්ජුනපාදයන්වහන්සේ සම්මුතියක් වූ සසර, නිවන සමග සංසන්දනය කිරම බලවත් වරදක් යැ යි මම සිතමි. සසර සංකල්පයකි. එහෙත් නිවන සංකල්පයක් නො වෙයි. නිවන සංකල්පයක් නම් නිවන් අවබෝධය එතරම් අපහසු දෙයක් නොවිය යුතු ය. අඩු ම තරමින් සංකල්ප, විශේෂයෙන් ම වියුක්ත සංකල්ප හදාරන්නන්ට එය එතරම් ගැටලුවක් නොවිය යුතු ය. එහෙත් නිවන් අවබෝධය එලෙස සංකල්පයක් ලෙස තේරුම්ගත නොහැකි බව අපි දනිමු. බුදුන්වහන්සේ කිසි දිනක නිවන යනු මේ යැ යි දේශනා නො කළහ. උන්වහන්සේ නිවනට නිර්වචනයක් නො දුන් සේක. බුදුන්වහන්සේ නිතර අනුගමනය කළ ක්‍රමය වූයේ නිවන යනු මෙ නො වේ ය, ඒ නො වේ ය ආදී වශයෙන් දේශනා කිරම ය.

නාගර්ජුනපාදයන්වහන්සේ නිවන සසරට සාපේක්ෂව ගත් හ. සසර ගැන දැන ගැනීමක් නොමැති ව නිවන ගැන දැනගැනීමට නොහැකිය යන්න ඉන් ගම්‍ය වෙයි. අඳුර ගැන නො දැන ආලෝකය ගැන වත් ආලෝකය ගැන නො දැන නිවන ගැන වත් අවබෝධ කර ගැනීමට නොහැකිවාක් මෙන් නිවන ගැන නො දැන සසර ගැන දැනගැනීමට නොහැකි යැ යි උන්වහන්සේ තමන්වහන්සේ ගේ මාධ්‍යමිකවාදය ඇසුරෙන් කියා දුන් හ. එහෙත් එසේ නිවන හා සසර එකිනෙකට සාපේක්ෂව ගැනීමෙන් හා අවසන නිවන හා සසර යනු ඒ සාපේක්ෂ අර්ථයෙන් එකක් ලෙස ගැනීමෙන් උන්වහන්සේ කළ වරද කෙතරම් බලවත් වී ද යත් බුදුදහම භාරතයෙන් තුරන් ව යෑමට එය ද ප්‍රධාන හේතුවක් විය.

සාපේක්ෂ යන වචනය විවිධ සන්දර්භයන්හි යොදා ගැනෙන ආකාරය අපි කලින් සඳහන් කළෙමු. ගැලීලීය සාපේක්ෂතාවාදය හා අයින්ස්ටයිනීය සාපේක්ෂතාවාදය නාගර්ජුනපාදයන්වහන්සේ ගේ සාපේක්ෂතාවාදයෙන් වෙනස් වන්නේ කෙසේ දැ යි අපි සාකච්ජා කළෙමු. අපට මෙහි දී වැදගත් වන්නේ එක් නිරීක්ෂකයකු හා සම්බන්ධ නාගර්ජුනපාදයන්වහන්සේ ගේ සාපේක්ෂතාවාදය මිස නිරීක්ෂකයන් දෙදෙනකු හෝ වැඩි ගණනක් සම්බන්ධ අයින්ස්ටයිනීය සාපේක්ෂතාවාදය නො වෙයි. නාගර්ජුනපාදයන්වහන්සේ ගේ සාපේක්ෂතාවාදය හා අයින්ස්ටයිනීය සාපේක්ෂතාවාදය යන දෙක ම එක ම යැ යි කියන්නන් ඒ දෙකෙන් එකක් වත් නොදන්නවා විය හැකි ය.

සම්මුතිය හා පරමාර්ථය පිළිබඳව ද අපේ අදහස් නිරවුල් විය යුතු ය. සම්මුතිය යන වචනයේ තේරුමෙන් ම පැවසෙන පරිදි යමක් සම්මුතියක්, සම්මුති සත්‍යයක් බවට පත්වන්නේ යම් එකඟත්වයකින් ය. අප පොල්ගස් යැ යි කියන්නේ එක්තරා ගස් වර්ගයකට ය. ඒ ගස් වර්ගයට අපි සියල්ලෝ ම පොල් ගස් යැ යි කියමු. ඒ ගස් අප සියල්ලන්ට ම එක ම ආකාරයකට ග්‍රහණය වෙයි. ඒ ගස්වල අඹ ගස්වල මෙන් අතු නැත. පොල්ගස් තාල වර්ගයේ ගස් යැ යි අපි කියමු. තාල වර්ගයේ ගස්වලට ඉහත කී ආකාරයෙන් ම අතු නැත. එනම්, ඒ ගස්වල අතු නැති බව අපට ග්‍රහණය වෙයි. එසේත් නැත හොත් ඒ ගස්වල අතු නැතැ යි යනුවෙන් අපි දැනුමක් නිර්මාණය කරගෙන සිටින්නෙමු. මෙයින් පැහැදිලි වන්නේ සාමාන්‍ය අර්ථයකින් නම් සම්මුති සත්‍යයක් ඇති වන්නේ, එසේත් නැත හොත් අප විසින් නිර්මාණය කෙරෙන්නේ, දෙදෙනකු හෝ එයට වැඩි ගණනක් නිරීක්ෂකයන් සිටින අවස්ථාවල දී බව ය.

දැන් එක් අයකු පමණක් සිටින අවස්ථාවක සම්මුතියක් ඇති කර ගත හැකි ද යන්න ප්‍රශ්නයක් වනු ඇත. ලෝකයේ පළමුවරට යම් සංකල්පයක් නිර්මාණය කරන තැනැත්තා එසේ කරන්නේ අනෙක් අය සමග සම්මුතියක් ඇති කර ගෙන නො වෙයි. නාගර්ජුනපාදයන්වහන්සේ වුව ද සාපේක්ෂතාව පිළිබඳ අදහස් තමන්වහන්සේ පළමුව නිර්මාණය කළ බව පැහැදිලි ය. නිව්ටන් විද්වතා ගුරුත්වාකර්ෂණ ප්‍රවාදය පළමුවෙන් ම ඉදිරිපත් කරන්නට ඇත්තේ අනෙක් විද්‍යාඥයන් ගේ කැමැත්ත අකැමැත්ත විමසා බලා නො වෙයි. එලෙස යමකු පළමුවරට සංකල්පයක් නිර්මාණය කරද්දී ඒ සංකල්පය සාපේක්ෂ වන්නේ ඔහුට පමණ ය. ඔහු ඉන්පසු ඒ සංකල්පය, ප්‍රවාදය අනෙක් අයට ද ක්‍රමයෙන් එත්තු ගැන්වීමට කටයුතු කරයි. එසේ නො කර ඒ විද්‍යාඥයාට පසේබුදුවරයකු මෙන් සිටිය නොහැකි ය. එසේ ඒත්තු ගැන්වීමෙන් පසුව ඒ සංකල්පය හෝ ප්‍රවාදය හෝ සම්මුතියක්, සම්මුති සත්‍යයක් බවට පත් වෙයි.

දෙදෙනකු එකතු වීමට පෙර සම්මුතියක් නැති වුවත් එවැනි සංකල්පවලට ද අපි සම්මුති සත්‍ය යැ යි කියමු. එනම් යම් සංකල්පයක් එක් අයකු පමණක් සතු ව ඇති විට ද අපි එයට සම්මුති සංකල්පයක් යැ යි කියමු. මෙහි දී

© Prof. Nalin De Silva

සම්මුතිය යන්න යොදා ගැනෙන්නේ ඉතා පළල් ආකාරයකින් ය. යම් පුද්ගලයකු තමාට ම පමණක් ඇති කරගත් සම්මුතියක් ඇතැ යි එවැනි අවස්ථාවක් සම්බන්ධයෙන් අපට සිතාගත හැකි ය. සම්මුති සත්‍යයක් සෑම විට ම සාපේක්ෂ වෙයි. එය යම් නිරීක්ෂකයකුට සාපේක්ෂ වෙයි. සාපේක්ෂ නො වූ සම්මුතියක් නො වූ සංකල්පයක් පැවතිය හැකි ද?

පැවැත්මෙහි හෙවත් සත්තාවෙහි අප විසින් පිළිතුරු දෙනු ලැබිය යුතු මූලික ප්‍රශ්නයක් වනුයේ එයයි. සාපේක්ෂ නො වූ සංකල්පයක් නිරපේක්ෂ සංකල්පයක් වෙයි. සම්මුතියෙන් තොර වූයේ පරමාර්ථ වෙයි. පරමාර්ථ නිරපේක්ෂ සංකල්ප තිබිය හැකි ද? එනම් පරමාර්ථ, නිරපේක්ෂ සංකල්පවලින් කියැවෙන දෑ ලෝකයෙහි තිබිය හැකි ද? මේ ප්‍රශ්නයට අද අප, එනම් නිර්මාණාත්මක සාපේක්ෂතාවාදීන්, දෙන පිළිතුර නම්, ඇත්තේ සාපේක්ෂ සම්මුති සංකල්ප පමණක් බව ය. ඒ ඒ වස්තු ස්වභාවයෙන් පැවැතීමක් හෝ ඒ ඒ වස්තුවලට නිරීක්ෂකයා ගෙන් ස්වායත්ත වූ නිසග ගුණ ඇති බවක් හෝ පරමාර්ථ පැවැත්මක් හෝ ඊනියා යථාර්ථයක් හෝ ඊනියා යථයක් හෝ අපි ප්‍රතික්ෂේප කරමු.

සංකල්පයක් යනු යම් නිරීක්ෂකයකු ගේ නිර්මාණයක් පමණකි. නිර්මාණයක් නො වූ සංකල්පය කුමක් ද? මෙහි දී අවධාරණය කළ යුතු ප්‍රධාන ම කරුණ නම් සංකල්පයක් යනුවෙන් අදහස් කෙරෙන්නේ වචනයකින් දැක්වෙන්නක් පමණක් නො වන බව ය. අප කලින් ද සඳහන් කර ඇති පරිදි චිත්තරූප ද සංකල්ප විය හැකි ය. අද බටහිර ලැකාන්වාදීන් හා ඔවුන් අනුකරණය කරන මෙරට පශ්චාත්නූතනවාදීන්, පශ්චාත්ව්‍යුහවාදීන්, පශ්චාත්මාක්ස්වාදීන් ආදීන් වශයෙන් තමන් හඳුන්වාගන්නා පුස්සන් සිතන්නේ භාෂාව විසින් අප මෙහෙයවෙන බව ය. ඔවුන්ට අනුව අප සිතන්නේ භාෂාවේ ආධාරයෙන් ය. එහෙත් මෙහි දී අප නගන ප්‍රධාන ප්‍රශ්නයක් වනුයේ භාෂා නිර්මාණය කර ගැනීමට පෙර මිනිසුන් නො සිතුවේ ද යන්න ය. භාෂාවක් නො දන්නා ළදරුවෝ නො සිතත් ද? ලැකාන්වාදීන් ඇතුළු ඊනියා මනෝ විශ්ලේෂකයන්ට හා සමස්තයක් වශයෙන් ගත් කල බටහිර සමාජීය විද්‍යාඥයන්ට ඔවුන් ප්‍රවාද (Theories) ගැන කෙතරම් කතා කළ ද ඔවුන්ට ප්‍රවාදයක් යනු කුමක් ද පිළිබඳ නිසි වැටහීමක් නැත. ඕනෑ ම අයකු, විශේෂයෙන් ම නමක් ඇති අයකු සිතන ඕනෑ ම දෙයක් ප්‍රවාදයක් ලෙස සැලකීමට ඔවුහු පෙළඹී සිටිති.

බටහිර භෞතික විද්‍යාඥයකුට ප්‍රවාදයක් යනු වන්දනාමාන කළ යුතු වූවක් නො වෙයි. ලෝකයේ තම තමන් නිරීක්ෂණය කරන සංසිද්ධි, එනම් තමන් විසින් නිර්මාණය කෙරෙන සංකල්ප ඔස්සේ නිර්මාණය කරගන්නා සංසිද්ධි, තේරුම් ගැනීම සඳහා නිර්මාණය කරන යම් යම් ප්‍රකාශන ප්‍රවාද වෙයි. උදාහරණයක් ලෙස ගත හොත් පොල්, ඇපල් ආදිය පොළොවට ඇද වැටීම තේරුම් ගැනීම සඳහා නිව්ටෝනීය ගුරුත්වාකර්ෂණ ප්‍රවාදය මෙන් ම අයින්ස්ටයිනීය සාධාරණ සාපේක්ෂතාවාදී ප්‍රවාදය ද නිර්මාණය වී ඇත. ප්‍රවාද හා නිරක්ෂණ එකිනෙකින් ස්වායත්ත වූ, වෙන් වූ දෑ නො වෙයි. ඒ සියල්ල අතර යම්කිසි සංගත බවක් වෙයි. ප්‍රවාදයක් යනු නිරීක්ෂණවලින් බාහිර ව පවතින වන්දනීය දැනුමක් නො වෙයි. අද සම්මත වී ඇති ප්‍රවාදයක් හෙට වෙනස් කරගැනීම බටහිර භෞතික විද්‍යාවට ගැටලුවක් නො වෙයි.

එහෙත්, සමාජීය විද්‍යාවන්ට ඒ බවක් නො තේරෙයි. බටහිර සමාජීය විද්‍යාවක් වූ මාක්ස්වාදයෙහි කියැවෙන සුප්‍රසිද්ධ ප්‍රකාශයක් නම් න්‍යායෙන් (එනම් ප්‍රවාදවලින්) තොර භාවිතයත්, භාවිතයෙන් තොර න්‍යායත් වඳ බව ය. ප්‍රවාදයෙන් තොර භාවිතයක් තිබිය නොහැකි ය. එමෙන් ම භාවිතයෙන් තොර ප්‍රවාදයක් ඇත්නම් එයට නියමිත තැන කුණු කූඩය ය. භාවිතයෙන් තොර ප්‍රවාද හා ප්‍රවාදයෙන් තොර භාවිතයක් ගැන කතා කිරමෙන් ම මාක්ස්වාදය පෙන්වා දී ඇත්තේ එයට සුදුසු ම තැන කුණු කූඩය බව ය. ලැකාන්වාදීහු ද එවැනි වැරැදි කරති. භාෂාවක් නො දන්නා ළදරුවන් නො සිතන බව ඔවුන් දන්නා ඊනියා ප්‍රවාදය වෙයි. එහෙත් මේ ප්‍රවාදය ළදරුවන් පමණක් නො ව බොහෝ සතුන් ද කරන දෙයින් අනාථ වෙයි. සතුන් ද සිතන බව අද බටහිර ජීව විද්‍යාඥයෝ දනිති. එහෙත් ලැකාන්වාදීහු ඒ බව නො දනිති. ඔවුන්ට අනුව ප්‍රවාදයෙන් කියැවෙන්නේ ළදරුවන් නොසිතන බව ය. එබැවින් එය නිවැරැදි ය.

ලැකාන් වැනි පුස්සෝ බටහිර විද්‍යාවක් ගැන කතා කළ ද බටහිර විද්‍යාවේ හරය නො දනිති. නිරීක්ෂණවලට පිටින් යන, නිරීක්ෂණ සමග එකඟ නො වන ප්‍රවාද බටහිර විද්‍යාවේ නොපවතිනවා නො වෙයි. එහෙත් එහි දී තමන් කරන්නේ කුමක් ද යන්න පිළිබඳ වැටහීමක් බටහිර විද්‍යාඥයන්ට ඇත. ග්‍රහවස්තුවල චලනය නිව්ටෝනීය ගුරුත්වාකර්ෂණ ප්‍රවාදය සමග මුළුමනින් ම එකඟ නො වෙයි. එහෙත් එපමණකින් බටහිර භෞතික විද්‍යාඥයන්

© Prof. Nalin De Silva

ගුරුත්වාකර්ෂණ ප්‍රවාදය ප්‍රතික්ෂේප කළා නො වෙයි. ඔවුහු ඉන් ලබාගත හැකි වැඩ සඳහා නිව්ටෝනීය ප්‍රවාදය යොදා ගත් හ. එහි අඩුපාඩුකම් දැන දැන එය යොදා ගත් හ. එහෙත් ලැකාන්වාදීන් ළදරුවන් සිතන්නේ නැත ආදී විකාර කතා නිරීක්ෂණවලට පටහැනි ව යොදාගන්නේ එහි අඩුපාඩුකම් දැනගෙන නො ව, ප්‍රවාදය සත්‍යයක් ලෙස සලකමින් ය. ඔවුන් සිතන්නේ යමක් ප්‍රවාදයක් නම් ඒ සත්‍ය විය යුතු ය කියා ය. ඔවුන්ට ප්‍රවාදයක් යනු අන් කිසිවක් නො ව ලැකාන් වැන්නන් අතින් ලියැවෙන ඕනෑ ම බහුබූතයකි.

භාෂාවෙන් අප යම් ප්‍රමාණයකට මෙහෙයවන බව සැබෑ ය. එහෙත් එසේ වන්නේ භාෂාවේ ඇති ගුණයක් නිසා නො ව භාෂාව ද සංස්කෘතියේ කොටසක් වීම නිසා ය. මිනිසුන්ට සංස්කෘතීන් ඇති වූයේ භාෂාවක් කතා කිරමට පටන් ගැනීමෙන් පසුව යැ යි සිතන්නෝ සංස්කෘතිය යනු කුමක් දැ යි නො දනිති. මිනිසුන්ට පමණක් නො ව සතුන්ට ද සංස්කෘතීන් ඇති බව බටහිර ජීව විද්‍යාඥයෝ දනිති. ලැකාන්වාදීන් ඒ බව නොදන්නේ නම් ඒ ඔවුන් ගේ ප්‍රශ්නයක් මිස අපේ ප්‍රශ්නයක් නො වෙයි. මිනිසුන්ට ජෛවීය ව හෝ සසර පුරුදු ලෙස හෝ නො ලැබෙන අන් සියල්ල ලැබෙන්නේ සංස්කෘතියෙන් ය. අවශ්‍ය නම් ඒ, සංස්කෘතියෙහි නිර්වචනය ලෙස ද සැලකිය හැකි ය. සසර පුරුදු යන්න යමකුට ප්‍රශ්නයක් වේ නම් ඔහුට දැනට ඒ අත්හැරිය හැකි ය.

අප මෙහෙයවන්නේ සංස්කෘතියෙන් ය. භාෂාව සංස්කෘතියෙහි වැදගත් ම වාහකය බවට පත් වී ඇත. එහෙත් එයින් කියැවෙන්නේ භාෂාව විසින් අප මෙහෙයවෙන බව නො වෙයි. එපමණක් නො ව භාෂාව ඇතිවීමට පෙර සංගීතය ඇති විණි යැයි අප මෙයට කලින් සඳහන් කර ඇත. කටින් පළමුවෙන් පිටවන්නේ ශබ්ද ය. ඒ ඇතැම් ශබ්ද වචන වී ඇත. සෑම වචනයක් ම ශබ්දයක් වන නමුත් සෑම ශබ්දයක් ම වචනයක් වන්නේ නැත. අනෙක් අතට අපට ශබ්ද නිර්මාණය කළ හැක්කේ කටින් පමණක් නො වෙයි. අතින් පයින් ද අපට ශබ්ද නිර්මාණය කළ හැකි ය. අපට අතින් පයින් සන්නිවේදනය කළ හැකි ය. සන්නිවේදනයට වුව ද භාෂාවක් පැවතීම අනිවාර්ය නො වෙයි. භාෂාව යනු සංස්කෘතියෙහි කොටසක් මිස සංස්කෘතිය යනු භාෂාවෙහි කොටසක් නො වෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva